සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# දෙවන වාර පරීක්ෂණය 2018

**11 ශ්‍රේණිය** **පුරවැසි අධ්‍යාපනය - I** **කාලය පැය 03 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

i. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.
ii. 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.
iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැලපෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

01. නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන රටවල පාලන කටයුතු වලදී ඡන්දදායකයාගේ අදහස් සෘජුවම විමසුමට ලක්කරන එක් ක්‍රමයක් වන්නේ
(1) ජනාධිපතිවරණයයි. (2) පාර්ලිමේන්තු මැතිවරණයයි.
(3) පළාත් පාලන මැතිවරණයයි. (4) ජනමත විචාරණයයි.

02. අයිතිවාසිකම් බුක්ති විඳිමින් ඒ හා බැඳුණු යුතුකම් ඉටුකරමින් ජීවත්වන ජන සමාජයක්,
(1) ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක් ලෙස හැඳින්වේ.
(2) යුතුකම් හා අයිතිවාසිකම් සුරකින ජන සමාජයක් ලෙස හැඳින් වේ.
(3) ලිබරල්වාදී ජන සමාජයක් ලෙස හැඳින්වේ.
(4) සාමූහිකවාදී ජන සමාජයක් ලෙස හැඳින්වේ.

03. යම් ප්‍රතිපත්ති මාලාවක් පදනම් කරගෙන පාලන බලය ලබාගැනීමේ අරමුණින් සංවිධානය වූ පුද්ගල කණ්ඩායම
(1) දේශපාලන පක්ෂ ලෙස හඳුන්වයි. (2) බලපෑම් කණ්ඩායම් ලෙස හඳුන්වයි.
(3) සිවිල් සමාජය ලෙස හඳුන්වයි. (4) විරුද්ධ පක්ෂය ලෙස හඳුන්වයි.

04. ඒකපක්ෂ ක්‍රමයක් පවතින රට වලට උදාහරණ අඩංගු පිළිතුර තෝරන්න,
(1) බ්‍රිතාන්‍ය, ඇමරිකාව, කියුබාව. (2) කියුබාව, උතුරු කොරියාව, චීනය.
(3) චීනය, උතුරු කොරියාව, ඇමරිකාව. (4) බ්‍රිතාන්‍ය, කියුබාව, චීනය.

05. මිනිසෙකු ලෙස ගරුත්වයකින් යුතුව සමාජයේ ජීවත්වීම සඳහා ඔහුට උපතින්ම ලැබෙන හිමිකම්,
(1) මූලික අයිතිවාසිකම් වේ. (2) මානව අයිතිවාසිකම් වේ.
(3) සිවිල් අයිතිවාසිකම් වේ. (4) සමාජීය අයිතිවාසිකම් වේ.

06. ජනතාවගේ දුක් ගැනවිලි පාලක පක්ෂයේ අවධානයට යොමු කිරීම,
(1) බලපෑම් කණ්ඩායම් මගින් ඉටුකළ යුතු කාර්යභාරයකි.
(2) සිවිල් සමාජය මගින් ඉටුකල යුතු කාර්යභාරයකි.
(3) නිදහස් මාධ්‍ය මගින් ඉටුකළයුතු කාර්යභාරයකි.
(4) දේශපාලන පක්ෂ මගින් ඉටුකළ යුතු කාර්යභාරයකි.

07. රාජ්‍ය තුළ නීතිය හා සාමය ආරක්ෂා කිරීමත් පුරවැසියන් පොදු අරමුණු ඉටුකර ගැනීම සඳහා මෙහෙයවීමත් සිදු කරනු ලබන්නේ,
(1) විධායකයයි (2) ව්‍යවස්ථාදායකයයි (3) අධිකරණයයි (4) ආණ්ඩුවයි

08. ජාතික රාජ්‍ය බිහිවීමට බලපෑ හේතුවක් වන්නේ මින් කුමක් ද,
(1) ධනවාදී ආර්ථිකය බිඳ වැටීම (2) නොදියුණු ආර්ථික තත්වය
(3) ජාතික ඒකාග්‍රතාවය (4) යටත් විජිතවාදය

09. ජනාධිපති ආණ්ඩුක්‍රමයක දැකියහැකි විශේෂ ලක්ෂණයක් වන්නේ මින් කුමක් ද,
(1) ව්‍යවස්ථාදායකය තුළින් විධායකය තේරීපත්වීම.
(2) විධායකය ව්‍යවස්ථාදායකයට සෘජුවම වගකීමට බැඳී නොසිටීම.
(3) ව්‍යවස්ථාදායකය හා විධායකය අතර සෘජු සබඳතාවක් දැකිය හැකි වීම.
(4) විධායකය ඉවත්කිරීමට ව්‍යවස්ථාදායකයට හැකියාව තිබීම.

10. මධ්‍යම ආණ්ඩුව සතු පරිපාලන බලතල යම් ප්‍රමාණයක් ප්‍රාදේශීය පාලන ඒකක වෙත පවරා දීම
(1) බලය විමධ්‍යගත කිරීම ලෙස හඳුන්වයි. (2) බලය බෙදාහැරීම ලෙස හඳුන්වයි
(3) බලතල බෙදා දැක්වීම ලෙස හඳුන්වයි. (4) බලතල විමධ්‍යගත කිරීම ලෙස හඳුන්වයි.

11. සන්ධීය රාජ්‍යයක සාර්ථක පැවත්ම සඳහා තිබිය යුතු ගුණාංගයක් වන්නේ මින් කුමක් ද?
(1) දෙවන මණ්ඩලයක් පැවතීම
(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ලිඛිතවීම.
(3) සියලු ජනකොටස් පොදු හැඟීමෙන් කටයුතු කිරීම
(4) ව්‍යවස්ථා අර්ථ නිරූපණ බලය අධිකරණයට පැවරීම.

12. පහත දැක්වෙන බලතල ඇසුරින් මධ්‍යම ආණ්ඩුව සතු බලතල අඩංගු පිළිතුර තෝරන්න,
A - විදේශ කටයුතු B - ජාතික නිවාස හා ඉදිකිරීම්
C - ජන හා සංඛ්‍යාලේඛන D - සමාජ සේවා හා පුනරුත්තාපන
(1) AB (2) BC (3) AC (4) CD

13. මධ්‍යම ආණ්ඩුවේ පරිපාලන කටයුතු පහසුකර ගැනීම සඳහාත් කාර්යක්ෂම මහජන සේවාවක් සැපයීම සඳහාත් ශ්‍රී ලංකාවේ ස්ථාපිත කර ඇති ආයතන පද්ධතිය වන්නේ මින් කුමක් ද?
(1) පළාත් සභාව. (2) පළාත් පාලන ආයතන.
(3) පාර්ලිමේන්තුව. (4) රාජ්‍ය සේවා කොමිසම.

14. වර්තමානයේ සමාජ සාධාරණත්වය ගොඩ නැගීම බිඳ වැටීමට බලපෑ හේතුවක් වන්නේ,
(1) රාජ්‍ය පාලනයේ කාර්යක්ෂම තාවය (2) නිලධාරීවාදය
(3) අල්ලස හා දූෂණය අඩුවීම (4) රාජ්‍ය පාලකයින් වගකීමෙන් කටයුතු කිරීම.

15. යහපාලනයේ දැකිය හැකි මූලික ගුණාංගයක් අඩංගු පිළිතුර තෝරන්න
(1) දූෂනයෙන් හා වංචාවෙන් යුතු රාජ්‍ය පාලනය හා පරිපාලනය.
(2) නීතියේ ආධිපත්‍ය මුලිනුපුටා දැමීම.
(3) රාජ්‍ය පාලන බලතල ක්‍රියාවට නංවන පුද්ගලයින් ජනතාවට වගකීමට බැඳී සිටීම.
(4) විනිවිදභාවයෙන් තොරව කටයුතු කිරීම.

16. බහු සංස්කෘතික සමාජයක ජනතාව එක්සත්ව කටයුතු කිරීමෙන්,
(1) අන්‍ය ආගම් හෝ සංස්කෘතින්ට ගරු නොවන ආකාරයට හැසිරීමට හුරුවේ.
(2) මිනිස් නිදහස ගිලිහේ..
(3) ප්‍රජාතන්ත්‍රවාදය තහවුරුවේ.
(4) ගැටුම් වැඩි වේ.

17. ඕනෑම අර්ථ ක්‍රමයකට මුහුණ දීමට සිදුවන ප්‍රශ්න හඳුන්වන්නේ,
(1) ආර්ථික ප්‍රශ්න ලෙසයි. (2) මූලික ආර්ථික ප්‍රශ්න ලෙසයි.
(3) මූලික සමාජීය ප්‍රශ්න ලෙසයි. (4) මූලික දේශපාලන ප්‍රශ්න ලෙසයි.

18. ආර්ථිකයක සිදුවන ක්‍රියාවලින් නිවැරදිව අඩංගු පිළිතුර වන්නේ මින් කුමක් ද?
(1) සම්පාදනය, බෙදාහැරීම, පරිභෝජනය. (2) නිෂ්පාදනය, බෙදාහැරීම, අලෙවිකිරීම.
(3) නිෂ්පාදනය, වෙළඳාම, පරිභෝජනය. (4) නිෂ්පාදනය, බෙදාහැරීම, පරිභෝජනය.

- පහත දැක්වෙන ප්‍රකාශන කියවා 19, 20, ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

A - ඇඳුම් පැළඳුම් B - පොහොර
C - ඖෂධ D - ගෘහභාණ්ඩ
E - දැව F - ආහාරද්‍රව්‍ය

19. ඉහත ප්‍රකාශ වලින් පාරිභෝගික භාණ්ඩ පමණක් අඩංගු පිළිතුර තෝරන්න,
(1) ABC (2) BCD (3) ACF (4) CDF

20. ඉහත ප්‍රකාශ වලින් අන්තර් භාණ්ඩ පමණක් අඩංගු පිළිතුර තෝරන්න,
(1) ABC (2) BDE (3) BDF (4) CDF

21. තිරසාර සංවර්ධනයේදී සැලකිය යුතු වැදගත් කරුණක් වන්නේ,
(1) ජනතා සහභාගීත්වය අඩුකර ගැනීම
(2) තම සංස්කෘතීන්ට පමණක් ගරු කිරීම.
(3) අනාගත පරම්පරාව සමඟ සබඳතා අඩු කිරීම.
(4) අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම.

22. අන්තර්ජාතික ගැටුම් ඇතිවීම කෙරෙහි බලපාන හේතු වන්නේ,
(1) සම්පත්, ආර්ථික ප්‍රතිලාභ, බල ව්‍යාප්තිය.
(2) අන්‍යමත ගරු නොකිරීම, ආර්ථික ප්‍රතිලාභ, බල ව්‍යාප්තිය.
(3) අන්‍ය සංස්කෘතීන් නොසලකා හැරීම, සම්පත්, බල ව්‍යාප්තිය.
(4) අන්‍ය ආගම් නොඉවසීම, සම්පත්, බල ව්‍යාප්තිය.

23. සාකච්ඡා ක්‍රමයේ ගති ලක්ෂණයක් අඩංගු පිළිතුර තෝරන්න,
(1) වියදම් අධික ක්‍රමයක් වීම.
(2) විධිමත් ව්‍යුහයකින් යුක්ත වීම.
(3) විසඳුම් පමාවී ලැබීම.
(4) පෞද්ගලික හෝ විශ්වසනීය මට්ටමකින් සිදුවීම.

24. සහමන්ත්‍රණය හා කේවල් කිරීම බහුලව භාවිතා කරන්නේ,
(1) කම්කරු ආරවුල් හා කාර්මික ආරවුල් විසඳීම සඳහාය
(2) පවුල් ආරවුල් හා සේව්‍ය සේවක ආරවුල් විසඳීම සඳහාය
(3) රටතුළ හා රටවල් අතර ගැටුම් විසඳීම සඳහාය
(4) ආයතනික හා ආයතන අතර ඇතිවන ආරවුල් විසඳීම සඳහාය.

25. ගැටුම් නිරාකරණයේදී පුද්ගලයා සතුවිය යුතු සමාජීය ගුණාංගයක් වන්නේ මින් කුමක් ද?
(1) කරුණාව.
(2) ඵලදායී සන්නිවේදනය.
(3) ඉවසීම.
(4) සවන්දීම.

26. නීතිය යනු රජය විසින් ක්‍රියාවට නංවනු ලබන අයිතිවාසිකම් හා බැඳීම් පිළිබඳ පද්ධතියක් ලෙස දුටුවේ,
(1) ජෝන් ඔස්ටින්
(2) ජෝන් ලොක්
(3) T. H. ග්‍රීන්
(4) G.D.H. කෝල්

27. නීතියේ මූලාශ්‍රයන් නිවැරදිව අඩංගු පිළිතුර තෝරන්න,
A - විවිධ අණ පනත්
B - දාර්ශනික අදහස්.
C - ආචාර ධර්ම
D - අධිකරණ තීන්දු
(1) AB
(2) AD
(3) CD
(4) BD

28. අධිකරණ සේවා කොමිෂන් සභා තීරණ විමර්ෂණය කිරීමේ බලය හිමිවී ඇත්තේ,
(1) ශ්‍රේෂ්ඨාධිකරණයට ය.
(2) අභියාචනාධිකරණයට ය.
(3) මහාධිකරණයට ය.
(4) දිසා අධිකරණයට ය.

29. විධායක හා පරිපාලන ක්‍රියා මගින් පුරවැසියන්ගේ මූලික මිනිස් අයිතිවාසිකම් හා සෙසු අයිතිවාසිකම් කඩවන අවස්ථාවල ඒවා ආරක්ෂාකර ගැනීම සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ගයක් වන්නේ,
(1) ශ්‍රේෂ්ඨාධිකරණය පිහිටුවීමයි.
(2) මානව හිමිකම් කොමිසම පිහිටුවීමයි.
(3) ඔම්බුඩ්ස්මන් ධුරය ස්ථාපිත කිරීමයි.
(4) අන්තර්ජාතික අධිකරණය වෙත යොමු කිරීමයි.

30. නීතියේ ආධිපත්‍ය තහවුරු වී පවතින සමාජයක දැකියහැකි ලක්ෂණයක් වන්නේ මින් කුමක් ද?
(1) සාධාරණව හා ප්‍රමාදව යුක්තිය පසිඳලීම.
(2) නීතිය ඉදිරියේ සියලු දෙනාම අසමාන පුද්ගලයන් සේ සැලකීම
(3) නීතිය නොදැන සිටීම නිදහසට කරුණක් සේ සැලකීම.
(4) ස්වාධීන අධිකරණ පද්ධතියක් ක්‍රියාත්මක වීම.

31. 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රමයෙන් ලැබුණු ප්‍රගතිශීලී යෝජනාවක් වන්නේ මින් කුමක් ද?
(1) ද්වි මාණ්ඩලික ව්‍යවස්ථාදායකය.
(2) රාජ්‍ය මන්ත්‍රන සභාව පිහිටුවීම
(3) අගමැති ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලයක් ක්‍රියාත්මක වීම..
(4) අග්‍රාණ්ඩුකාර ධුරයක් ස්ථාපිත කිරීම.

32. 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පාදනය කිරීමේදී ක්‍රියාත්මක කළ නවාංගයක් වන්නේ මින් කුමක් ද?
(1) රාජ්‍ය සේවා කොමිසම ස්ථාපිත කිරීම.
(2) මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයක් හඳුන්වාදීම.
(3) සමානුපාතික නියෝජන ක්‍රමය හඳුන්වාදීම.
(4) අගමැති ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලයක් ක්‍රියාවට නැංවීම.

- පහත ප්‍රකාශන කියවා 33, 34 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

A - ඵලදායි ජීවන වෘත්තියක නියැලීම.
B - ගැටුම් ඇතිකර ගැනීමෙන් වැලකීම.
C - නිදහස. සාධාරණත්වය හා අයිතිවාසිකම් සුරුකීම.
D - අන්මත ඉවසීම හා ගරු කිරීම.
E - සාකච්ඡා මාර්ගයෙන් ගැටලු විසඳා ගැනීම.
F - රාජ්‍ය සුභ සාධන සේවා අයථා ලෙස පරිහරනයෙන් වැලකීම.

33. ඉහත ප්‍රකාශ වලින් ජාතික ආරක්ෂාව පවත්වාගෙන යාමට සහය වීම සඳහා පුරවැසියාගෙන් ඉටුවිය යුතු වගකීම් හා යුතුකම් අඩංගු පිළිතුර තෝරන්න,
(1) ABC (2) ACF (3) BDE (4) BDF

34. ඉහත ප්‍රකාශ වලින් සමාජ සංවර්ධනය පවත්වාගෙන යාමට සහාය වීම සඳහා පුරවැසියන්ගෙන් ඉටුවිය යුතු වගකීම් හා යුතුකම් අඩංගු පිළිතුර තෝරන්න,
(1) ABC (2) ACF (3) BDE (4) BDF

35. මරණ දඬුවම අහෝසි කිරීම අරමුණු කොටගෙන සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියට එකතු කළ ගිවිසුම
(1) සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ පළමු වෛකල්පික සම්මුතිය ලෙස හඳුන්වයි.
(2) සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ දෙවන වෛකල්පික සම්මුතිය ලෙස හඳුන්වයි.
(3) සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය ලෙස හඳුන්වයි.
(4)ආර්ථික සාමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සඳහා ඇතිකළ වෛකල්පික සම්මුතිය ලෙස හඳුන්වයි.

36. ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය මගින් සහතික කර ඇති ළමා අයිතිවාසිකමක් අඩංගු පිළිතුර තෝරන්න
(1) කැමති තැනක යාම ඒමේ නිදහස. (2) කැමති යහළුවන් ඇසුරු කිරීමේ නිදහස.
(3) ප්‍රකාශනයේ නිදහස. (4) තම අභිමතය අනුව කටයුතු කිරීමේ නිදහස

37. වැඩ කරන ජනතාව වෙනුවෙන් සමාජ සාධාරණත්වය ඉටුකිරීම අරමුණු කරගෙන 1919 දී බිහි වූ සංවිධානය
. (1) අන්තර්ජාතික කම්කරු සංවිධානය ලෙස හැඳින්වේ.
(2) අන්තර්ජාතික රතුකුරුස සංවිධානය ලෙස හැඳින්වේ.
(3) අන්තර්ජාතික මානව හිමිකම් සුරුකීමේ සංවිධානය ලෙස හැඳින්වේ.
(4) අන්තර්ජාතික කම්කරු අයිතිවාසිකම් සුරුකීමේ සංවිධානය ලෙස හැඳින්වේ.

38. ධරණීය සංවර්ධනය සඳහා ප්‍රධාන වන්නේ.
(1) පරිසරයයි. (2) වායුගෝලයයි (3) මිනිසායි. (4) ජලගෝලයයි.

39. පරිසර සංරක්ෂණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන දෙපාර්තමේන්තුවක් වන්නේ.
(1) පරිසර සංරක්ෂණ දෙපාර්තමේන්තුවයි. (2) සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියයි
(3) පතල් කැනීමේ දෙපාර්තමේන්තුවයි (4) භූ විද්‍යා සැලසුම් දෙපාර්තමේන්තුවයි

40. පවුල් ඒකකය මෙන්ම පුද්ගල ජීවිතය යහපත් අයුරින් ගොඩ නැගීමට දායක වන ඉතා වැදගත් ආයතනයක් වන්නේ,
(1) පන්සල යි. (2) පාසල යි. (3) විශ්ව විද්‍යාලය යි. (4) සමාජය යි.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## දෙවන වාර පරීක්ෂණය 2018

**11 ශ්‍රේණිය**

# පුරවැසි අධ්‍යාපනය - II

| නම/ විභාග අංකය: |
|---|

- **පළමු ප්‍රශ්නය ඇතුලුව තවත් ප්‍රශ්න හතරක් සහිතව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 20 යි. තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් හිමි වේ.**

---

(01) i. ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ අදහස් ඉදිරිපත්කළ චින්තකයින් දෙදෙනෙක් නම් කරන්න.

ii. වර්තමාන ආණ්ඩුක්‍රමය තුළ ව්‍යවස්ථාදායකයේ කාර්යයන් දෙකක් ලියන්න.

iii. ඒකීය ආණ්ඩුක්‍රම පවතින රටවලට උදාහරණ 2 ක් ලියන්න.

iv. බලයේ විවිධ ස්වරූප දෙකක් නම් කරන්න.

v. ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීම කෙරෙහි බලපා ඇති සාධක 2 ක් ලියන්න.

vi. පරිවර්තන ආර්ථිකයක දැකිය හැකි ප්‍රධාන ලක්ෂණ 02 ක් ලියන්න.

vii. රටක අභ්‍යන්තර ගැටුම් බෙදා දැක්විය හැකි කොටස් දෙක නම් කරන්න.

viii. නීතිය ක්‍රියාවට නංවන ප්‍රධානීන් දෙදෙනෙක් ලියා දක්වන්න.

ix. 1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිටු වූ ද්විත්ව මණ්ඩල නම් කරන්න.

x. යුතුකම් වර්ගකර දැක්විය හැකි කොටස් දෙක නම් කරන්න.

(ලකුණු 2 × 10 = 20)

(02) i. පාලන ක්‍රමයක් ලෙස ඍජු ප්‍රජාතන්ත්‍රවාදය වර්තමානයේ ක්‍රියාත්මක වීමේදී මතුවන ගැටළු දෙකක් ලියන්න. (ලකුණු 02)

ii. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් සාර්ථක කර ගැනීම සඳහා විරුද්ධ පක්ෂයෙන් ඉටුවිය යුතු කාර්යයන් තුනක් ලියන්න. (ලකුණු 03)

iii. පුරවැසියන් කෙරෙහි රජයේ වගකීම් තුනක් දක්වා එකක් විස්තර කරන්න. (ලකුණු 05)

(03) i. භාණ්ඩ නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ප්‍රධාන ශිල්ප ක්‍රම දෙකක් ලියන්න. (ලකුණු 02)

ii. නිෂ්පාදන සාධක තුනක් නම් කරන්න. (ලකුණු 03)

iii. දැනට සිදු වෙමින් පවතින සංවර්ධන ක්‍රියා නිසා ශ්‍රී ලංකාවට අත්වන වාසි තුනක් ලියා එකක් විස්තර කරන්න. (ලකුණු 05)

(04) i. මනසේ සාමය ඇතිකර ගැනීම සඳහා යොමුවිය හැකි අංශ දෙකක් ලියන්න. (ලකුණු 02)

ii. ගැටුම් ඇතිවන මුල තුනක් නම් කරන්න (ලකුණු 03)

iii. ගැටුම් නිරාකරණයේදී මැදිහත් කරුවෙකු සතුවිය යුතු වැදගත් ගුණාංග තුනක් දක්වා එකක් විස්තර කරන්න. (ලකුණු 05)

(05) i. නීතියේ ගුණාංග දෙකක් ලියන්න. (ලකුණු 02)

ii. දේශීය නීතිය බෙදා දැක්විය හැකි ප්‍රධාන කොටස් තුන නම් කරන්න. (ලකුණු 03)

iii. (i) ශ්‍රේෂ්ඨාධිකරණය සතු විය යුතු බලතල 3 ක් ලියන්න. (ලකුණු 03)

(ii) අභියාචනාධිකරණය සතු විය යුතු බලතල 2 ක් ලියන්න. (ලකුණු 02)

(06) i. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පළාත්පාලන ආයතන දෙකක් ලියන්න. (ලකුණු 02)

ii. ශ්‍රී ලංකාවේ පලාත් පාලන ආයතන වලට පැවරී ඇති කාර්යයන් බෙදා දැක්විය හැකි ප්‍රධාන තේමා තුන ලියන්න. (ලකුණු 03)

iii. පළාත් පාලන ආයතනවල ප්‍රයෝජන තුනක් දක්වා එකක් විස්තර කරන්න. (ලකුණු 05)

(07) i. කාන්තාවන්ගේ මානව හිමිකම් සුරුකීම් සඳහා ලංකාව ගෙන ඇති ක්‍රියා මාර්ග දෙකක් ලියන්න. (ලකුණු 02)

ii. ළමා අයිතිවාසිකම් සම්මුතිය සකස් කිරීමේදී ළමයා පිළිබඳ සුවිශේෂී අවධානය යොමු කළ විශේෂ කරුණු තුනක් ලියන්න. (ලකුණු 03)

iii. (i) පුද්ගලයා සතු සිවිල් අයිතිවාසිකම් දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) පුද්ගලයා සතු දේශපාලන අයිතිවාසිකම් තුනක් ලියන්න. (ලකුණු 03)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(4) | 2 -(1) | 3 -(1) | 4 -(2) | 5 -(2) | 6 -(3) | 7 -(4) | 8 -(3) | 9 -(2) | 10 -(1) |
| 11-(3) | 12 -(3) | 13 -(2) | 14 -(2) | 15 -(3) | 16 -(3) | 17 -(2) | 18 -(4) | 19 -(3) | 20 -(2) |
| 21-(4) | 22 -(1) | 23 -(4) | 24 -(1) | 25 -(4) | 26 -(3) | 27 -(2) | 28 -(3) | 29 -(3) | 30 -(4) |
| 31-(2) | 32 -(3) | 33 -(2) | 34 -(3) | 35 -(2) | 36 -(3) | 37 -(1) | 38 -(2) | 39 -(2) | 40 -(2) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

(01) i. ඒබ්‍රහම් ලින්කන්, සීලර්, ii. නීති සම්පාදනය, අයවැය පාලනය, iii. ශ්‍රී ලංකාව, ප්‍රංශය, මහා බ්‍රිතාන්‍යය
iv. දේශපාලන බලය, පරිපාලන බලය. , v. පිහිටීම සංක්‍රමනය, ආක්‍රමන........ ආදී
vi. ආර්ථික ලිහිල්කරණය, පෞද්ගලික ව්‍යපාර දිරිගැන්වීම ආදී..... , vii. I. සාර්ව ගැටුම් II. සූක්ෂම ගැටුම්
viii. නීතිපති, අධිකරණ ඇමති, අග්‍රවිනිශ්චකාරවරයා, ix. ම. ම. ම. , සෙනෙට් මණ්ඩලය
x. නීතිමය යුතුකම්, සදාචාරාත්මක යුතුකම් (ලකුණු 2×10=20)

(02) i. ● රාජ්‍ය භූමිප්‍රමාණයෙන් විශාලවීම ● අධික ජනගහනයකින් සමන්විත වීම ● සමාජ අවශ්‍යතා සංකීර්ණයවීම .... ආදී (ල.02) ii. ● ආණ්ඩුපක්ෂයේ යහපත් වැඩ කටයුතු ඉටුකර ගැනීම සඳහා සහාය ලබා දීම ● ආණ්ඩුපක්ෂයේ ක්‍රියාකාරකම් ගැන සොයා බලා සංවර්ධනාත්මක විවේචන ඉදිරිපත් කිරීම. ● ආණ්ඩුපක්ෂයේ ප්‍රජාතන්ත්‍රවිරෝධී ප්‍රතිපත්ති වලට විරුද්ධ වීම. ● වඩා යහපත් විකල්ප ආණ්ඩුවක් පිහිටුවීමට ක්‍රියා කිරීම. (ල.03) iii. ● නීතිය හා සාමය ආරක්ෂා කිරීම. ● සමානාත්මතා මුලධර්මය ආරක්ෂා කිරීම. ● පරිසරය ආරක්ෂා කොට සුරක්ෂිත කිරීම ....... ආදී තුනක් ලියා එකක් විස්තර කළ යුතුය.
(කරුණු තුනට 3 යි. විස්තරයට 2 යි.) (ල.05)

(03) I. ප්‍රාග්ධන සූක්ෂම, ශ්‍රම සූක්ෂම (ල.02) ii. භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසාය (ල.03) iii. ● සේවා නියුක්තිය ඉහළයාම ● යටිතල පහසුකම් වර්ධනය වීම ● නව රැකියා වෙළඳපල පුළුල්විම ආදි කරුණු 3 ක් ලියා එකක් විස්තර කිරීම. (ල.03 + 02 = 05)

(04) i. ● ආගමික වතාවත් කෙරෙහි යොමු වීම ● මනෝ විද්‍යාත්මක අභ්‍යාස ● උපදේශනය ● ස්වභාවික පරිසරය නිරීක්ෂණය (ල.02) ii. වාර්ගිකත්වය, දේශපාලනය, ආගමික මතවාද, සමාජ ආර්ථික තත්වය ආදිය..... (ල.03)
iii. ● හොඳ සවන්දෙන්නෙකු වීම. ● විශ්වාසවන්තභාවය, ● කැපවීම ● අවංක වීම ● අපක්ෂපාතී වීම ආදී කරුණු තුනක් ලියා එකක් විස්තර කිරීම (කරුණු තුනට 3 යි. විස්තරයට 2 යි.) (ල.05)

(05) i. ● යුක්ති සහගත හා සාධාරණ වීම ● නීති කඩකළ විට දඬුවම් ලැබීම අනිවාර්යවීම ● පොදු සමාජ යහපත අරමුණු කරගෙන පැනවීම ● අධිකාරී බලය පදනම් කරගෙන රජය විසින් පැනවීම ...... ආදී, (ල.02) ii. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය, ● සිවිල් නීතිය, අපරාධ නීතිය (ල.03) iii. (i) ● අවසාන අභියාචනාධිකරණ බලය ● රීති සැකසීමේ බලය. ● උපදේශනාත්මක අධිකරණ බලය ● මූලික අයිතිවාසිකම් කඩවීම පිළිබඳ පෙත්සම් විභාග කිරීමේ බලය ...... ආදී. (ල. 03) (ii) ● පාර්ලිමේන්තු මැතිවරණ පෙත්සම් විභාග කිරීමේ බලය ● විවිධ ආඥා නිකුත් කිරීමේ බලය. ● මුල් අවස්ථා අධිකරණ වාර්තා විමර්ශනය කිරීමේ බලය ආදී... (ල. 02) (ල.05)

(06) i. ● මහනගර සභා, නගරසභා, ප්‍රාදේශීය සභා ii. ● පොදු මංමාවත් ● මහජන සෞඛ්‍ය ● පොදු උපයෝගිතා සේවා (ල.03) iii. ප්‍රාදේශීය සංවර්ධනය වේගවත් වීම , ප්‍රාදේශීය නායකයින් ජාතික නායකයින් විමට පසුබිම සැලසීම, මහජන උපයෝගීතා සේවාවන් පහසුවෙන් ලබා ගැනීමට හැකි වීම ආදීය ..
(3 + 2 = 05)

(07) i. 1993 ශ්‍රී ලංකාව කාන්තා ප්‍රඥප්තිය සකස් කිරීම. ● කාන්තා කටයුතු සම්බන්ධ අමාත්‍යාංශයක් පිහිටු වීම. ● කාන්තාවකට වන අසාධාරනකම් ගැන සොයා බැලීමට ජාතික කාන්තා කමිටුව පිහිටුවීම... ආදී (ල.02)
ii. ● ආරක්ෂාව පැවැත්ම සංවර්ධනය සහාගීත්වය iii. (i) ●සිතීමේ හා සාක්ෂියේ හා ආගමික නිදහස. ● ගමනා ගමන නිදහස. ● අමානුශික සැලකිලි වලින් මිදීමේ නිදහස (ල. 02) (ii) කැමති පුද්ගලයකුට ඡන්දය දීමේ නිදහස නිදහස් අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස ආදිය... (ල. 03) (ල.05)